## බාඳුරා මලට වැසූ මීමැස්සා

සුවඳක් දස අත විහිදෙයි
පුංචි සතුන් සුවඳ දෙසට
සෙමින් සෙමින් පිය මනියි
තිබෙන කුසගින්න
තව තව වැඩිවේ
අහෝ පුදුමයකි
මලක් ය මේ සුවඳ විහිදන්නේ
රස අහර ඇත මේ තුළ සැඟවී
විගසින් දිව ගියේ මල තුළට
අඳුරු වූවා මල ඇතුළ
පෙති හැකිළුණා මලේ සැම තැන
මා තනිවුණා මේ මල ඇතුළත

♦ **අරුණි ඉරේෂා ජයසිංහ**
ශ්‍රී සුදර්ශන දහම් පාසැල
නිල්පනාගොඩ - මිනුවන්ගොඩ

## හිරු පායා

සුරංගනා කතා කියා මා නළ වනවා
හරි ලස්සන කවි මා හට කියලා දෙනවා
රසම රසට කැවිලිත් මට හදලා දෙනවා
මට මිණිමුතු වලට වඩා ඇයව වටිනවා


පොල්ගෙඩියක් විතර කොණ්ඩෙ බඳිනවා
මල් වැටිච්ච හරි ලස්සන ඔසරි අඳිනවා
රස කර කර හරිම රසට කතා කියනවා
දෙවි පිහිටයි ආත්තම්මට ආයු පතනවා

♦ **සඳුනිකා චන්ද්‍රසේන**
*දෙණිකේ මහ විදුහල,*
*රිකිල්ලගස්කඩ Sri Lanka*

## අම්මාගේ සිනාව

සුදුපාට පෙතිත් සුවඳ රොන් පොදක්
ගැට පිච්ච මලට ගෙනැත් දෙයි හැඩක්
මගේ සුදු මවත් ඒ තුම් මව් සෙනේහයත්
මා ලෝකය තුළට වන් පිනක්
මුතු කැට පින්න අව්වට දිය වුනාම
දියුවුණු පින්න මල් මත විසිරුණාම
විසිරුණු පින්න සුවඳට එක්වුනාම
වාගෙයි අම්මෙ ඔබෙ ලස්සන සිනාව

♦ **ජීවනී මේනකා මිහිරාණි**
සමුද්‍රදේවී බාලිකා විද්‍යාලය - නුගේගොඩ




## The First Stamp in Sri Lanka
## ශ්‍රීලංකාවේ ප්‍රථම මුද්දරය බිහිවීම

It was 150 years ago, on April 1, 1857 that the first adhesive stamp was issued in Sri Lanka (then Ceylon). The value was 6 pence. (Decimal currency Rupee and Cents was adopted only in 1872) Perkins Bacon & Co Ltd printed this first stamp. It had a purplish colour and the sheet did not have perforations and had to be cut from the sheet.

The stamp carried the left profile of the head of Queen Victoria, the ruler of the British Empire who was also Ceylon's monarch and the words 'CEYLON' and ' SIX PENCE'

වසර 150 කට පෙර 1857 අප්‍රියෙල් 1 වෙනි දින ප්‍රථම අලවන මුද්දරය ලංකාවේ නිකුත් කෙරිණ. මිළ පැන්ස 6 කි. ( රුපියල් සත ලංකාවේ භාවිතයට පැමිණියේ 1872 දීය) මුද්දරයේ වර්ණය ලා දම්පැහැය වූ අතර ඒවා එකින් එක වෙන් කරන හිල් පේලි නොවූයෙන් කතුරකින් කපාගත යුතු වීය. ලංකාව එංගලන්තයේ යටත් විජිතයක් වූ බැවින් එකල බ්‍රිතාන්‍යයේ රජකළ වික්ටෝරියා රැජිණගේ හිසේ රූපයක් ද, සිලෝන් සහ සික්ස් පෙන්ස් යන ඉංග්‍රීසි අකුරුද මුද්දරයේ වීය.

♦ ***Auntie Ramani*** (**රමණී නැන්දා**)

## මකුළුවා දැලක් වියයි

මා වහළ දෙස බලා සිටින විට මකුළුවෙක් සිටියා. මා ළං වී බලන විට මකුළුවා දැලක් වියන බව මා දැක්කා. මම වාඩිවී බලා සිටියා. මකුළුවා පරාල දෙකක් අතරේ උඩට පහළට යනවා මා දැක්කා. එය ළඟට මදුරුවෙක් පැමිණියා. මකුළුවා තමා කරන වැඩේ පැත්තකට දමා ගොසින් මදුරුවා ගිලදැමුවා.

♦ **යසාරා ගව්නි**
ශ්‍රී හෘදය කන්‍යාරාමය බා.ම.වි.
ගාල්ල Sri Lanka


ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි

**ලංකා බැංකුව**
**BANK OF CEYLON**
ලන්ඩන් ශාඛාව

වසර 57 කටත් වඩා කාලයක් පුරා ලන්ඩන් නගරයේ ඔබේ මුදල් අවශ්‍යතා සපුරාලමින් සේවය කරයි.

හෙට දවසේ සිහින සැබෑකරන
**NRFC** ගිණුමක් අරඹන්න !
*උපයාගත් විදේශ මුදලට වැඩි වටිනාකමක් !*

***ලංකා බැංකුව අනේවාසික ගිණුම් හිමියන් සඳහා නොමිළයේ ජීවිත රක්ෂණ ව්‍යාපෘතියක් යළි හඳුන්වා දෙයි.***

පවුම්, ඩොලර්, යූරෝ හෝ රුපියල් වලින් ඔබ ශ්‍රීලංකාවට මුදල් යවන විට අපේ සේවා භාවිතා කරන්න. එය ඉතා සුරක්ෂිතය, ලාභදායකය, කාර්යක්ෂමය.


ශ්‍රීලංකාව පුරා ලංකා බැංකු ශාඛා **301** කි. ඉන් **256** කම කටයුතු පරිගණක ජාලගත-කර ඇත. ඕනෑම ශාඛාවකින් පවුලේ අයට හෝ නෑදෑ හිතවතුන්ට මුදල් යැවීමේ දී එය ගිණුම් වලට බැරකිරීමට හෝ ශාඛාවේදී මුදල් අතටම ලබාදීමට හෝ හැකි ය.

★ ***ආකර්ෂණීය විනිමය අනුපාතිකය.***
★ ***ඕනෑම වානිජ හෝ ඉතිරිකිරීමේ බැංකුවකට යැවිය හැක.***

ඔබගේම චෙක්පත් **කළමනාකරු, ලංකා බැංකුව, ලන්ඩන්** යනුවෙන් ලියා, ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, බැංකුවේ නම හා ශාඛාව දක්වා තැපැල් මගින් අපට යොමුකරන්න. (බ්‍රිතාන්‍ය මූල්‍ය රෙගුලාසිවලට යටත්ව)
***වැඩි විස්තර සඳහා :***

**No 1, Devonshire Square, London EC2 M4WD**
**Phone : 020 7377 1888 Fax: 020 7377 5430**
**e-mail : bankofceylon.uk@btclick.com**
**Our Web - www.boc.lk**
**Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit**


# ප්‍රේක්ෂක ප්‍රසාදය ඉහළ නැංවූ කැළණි පාලම



ලැයිසා, රූපවතී, මැටිල්ඩා සමග චුට්ටෙ කැළණි පාලම උඩ පදිංචියට විත් දවසේ සිදුවීම් ගැන කතිකාවේ.

**ස**ම්මාන දිනූ ප්‍රවීන නාට්‍යකරු ආර් ආර් සමරකෝන් ශූරීන්ගේ කැළණි පාලම වේදිකා නාට්‍යයේ ලන්ඩන් නිශ්පාදනය දැනට හතර වෙනි වතාව ටත් පසුගිය ඔක්තෝබර් 21 වෙනි දින ලන්ඩනයේ රයිස්ලිප්හි සර් වින්ස්ටන් චර්චිල් ශාලාවේ දී වේදිකාගත විය. මෙම නාට්‍යය ලන්ඩන් වේදිකාවට සකස්කර නිශ්පාදනය කරන ලද්දේ ප්‍රවීන නාට්‍ය ශිල්පියෙකු හා සිනමා නළුවෙකුද වන, කලක් තිස්සේ ලන්ඩන යේ වසන ගාමිණී අබේසිංහයන් විසිනි.


**කැළණි පාලම** ලෙහෙසි පහසු නිර්මාණයක් නොවේ. එහි අන්තර්ගත ප්‍රබල තේමාව නිසා නාට්‍යයේ සාර්ථ කත්වය රඳා පවත්නේ එහි චරිතයන්ට ඉතා විශ්වසනීය අයුරින් පණ දිය හැකි නළුනිළි පිරිසක් ඇති නම් පමණි. කැළණි පාලම, මෙම ලන්ඩන් නිශ්පා දනය, සැබවින්ම ඒ අභියෝගය ජයගෙන ඇතුවා මෙන්ම ශ්‍රී ලංකාවේ දී දකින මූලික නිශ්පාදනයන් හා සමාන වන අයුරින් මෙම නිශ්පාදනයෙහි ද පාත්‍ර වර්ගයා ඒ චරිතයන්හි ජීවත් වූ ආකාරය ප්‍රශංසනීය ය.

ගාමිණී අබේසිංහ, විජය පොල්පිටිය, කුමාර් වික්‍රමසිංහ, චන්න කබ්රාල්, ආසිරි බණ්ඩාර, ජනක අලහප්පෙරුම, බුද්ධි කිරිලියනගේ, ධනරත්න විතානගේ, සන්ධ්‍යා ට්‍රෙනර්, අමිතා කුල රත්න, ශීලා මඩවල, හේමා කෝරළගේ, ක්ලේරා ඕපාත, මද්දුම රත්නායක සහ දේවින්ද කබ්රාල් කැළණි පාලමේ චරිත මැවූහ.

කැළණි පාලම නාට්‍යයේ කතාව ගෙතී ඇත්තේ කොළඹ ඔරුගොඩවත්ත පෙදෙසේ කැළණි පාලම අසබඩ කීර පලා වවා ජීවත්වන පීඩිත පන්තියේ ජනයා ගඟ පිටාර ගලා තම ජීවිකාව විනාස වූ පසු පාලම උඩට විත් වතුර බැස යනතුරු ජීවත්වන ආකාරයයි. එම ඉරණම අද දවසේද එයාකාරය

අප රටේ හැම අතින්ම බැටකන අහිංසක ජන ජීවිතයේ ඛේදනීය පැත්තක් ඉතා තාත්විකව කියාපාන මෙම කැළණි පාලම හදවතට ආමන්ත්‍රණය කරන නාටකයකි. එය අවසානයේ සමස්ත ප්‍රේක්ෂක ඇසට කඳුළක් නංවන්නට සමත් වෙයි. සිංහල නාට්‍යයකට පහසුකම් අවම මෙවන් රටක මෙම ලන්ඩන් නිශ්පා දනය හැම අතින්ම සාර්ථක ප්‍රයත්නයක් බව මෙහි නිශ්පාදක වරයාට ද, රඟපෑ සියල්ලන්ටම ද ප්‍රශංසා වශයෙන් ලියා තබමි.

♦ **වෙනුර**



ශ්‍රීලංකා මහකොමසාරිස් කෂේණුකා සෙනෙවිරත්න මහත්මිය නාට්‍යයේ අධ්‍යක්ෂක ගාමිණී අබේසිංහ සහ නළු බුද්ධි කිරිලියනගේ වෙත තම ප්‍රසාදය පළ කළ අයුරුය මේ.

# සුරඟන දූව ටෙලි වෘතාන්තය



ලීලානි පෙරේරා සහ පියුමාංජලී නානායක්කාර සුරඟන දූව ජවනිකාවක



ජනප්‍රිය නිළි රැජිණ මාලිනී පොන්සේකා අධ්‍යක්ෂනය කළ, ලන්ඩනයේ රූගත කළ, සුරඟන දූව ටෙලි වෘතාන්තය ළඟදීම ශ්‍රීලංකාවේ පුංචි තිරයට ඒමට නියමිතය. මෙහි නිශ්පාදකවරිය ලන්ඩනයේ වාසය කරන ප්‍රකට කලාකාරියක වන ලීලානි පෙරේරා මහත්මියයි. මේ ලීලානි අතගැසූ 5 වෙනි නිශ්පාදනයයි. දක්ෂ නිළියක වන ඇය මෙහි කැපී පෙනෙන චරිතයක් ද රඟදක්වයි. ජවනිකාවක් රූගත කිරීමට පෙර අධ්‍යක්ෂිකා මාලිනී පොන්සේකා යම් උපදෙසක් දෙන අයුරු මෙම රූපරාමුවේ දැක්වේ.

වමේ සිට - කැමරා ශිල්පි සමන් සිගේරා, මයික් කුක්, රවීන්ද්‍ර රන්දෙනිය සහ ශ්‍රීමල් වෙඩිසිංහ සාවධානව අසා සිටිති.